2. නිපුණතා මට්ටම- මානව හා සත්ව රූප ඇතුළත් පරිසරය පුළුල්ව අධ්‍යනය කර චිත්‍ර සංරචනය කරයි
3. ක්‍රියාකාරකම (මාතෘකාව )- "අඳුරු රැයක පුදබිමක අසිරිය")

4.සිසුන් කළ යුතු කාර්යය

- ඔබ රාත්‍රී කාලයේ සහභාගි වූ ආගමික අවස්ථාවක් සිහියට නගා ගන්න
- තම මතකයේ ඇති අවස්ථාවක් මතකයට නගා ගැනීම තුලින්,හැඩතල භාවිතයේ දී හා පසුබිම ගොඩනැගීමේ දී ගැටලු ඇතිවී ම අවම වේ.
- ඉහත මාතෘකාව අනුව, තම නිදහස් රේඛාව භාවිතා කරමින් තරමක් විශාල හැඩතල යොදා තලය (කඩදාසි මතුපිට )පිරෙන්න ප්‍රකාශන චිත්‍රයක් ගොඩ නගන්න.
- විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය තුළින් ඉහත මාතෘකාවට අදාල ඡායාරූප අධ්‍යයනය කරන්න,නමුත් එහි පිටපතක් නොවන්න.
- කාලය උපරිම පැය 02 ක් ඇතුලත නිම කිරීමට උත්සාහ ගන්න.

5.අවශ්‍ය ද්‍රව්‍ය

- චිත්‍ර ඇඳීමට සුදුසු A4 ප්‍රමාණයේ කඩදාසියක් (කඩදාසියේ උස පැත්තට හෝ දිග පැත්තට)
- සුදුසු වර්ණ මාධ්‍යයක්.(පැස්ටල්,දියසායම)

6.ඇගයීම

- ගැලපෙන ලෙස තලය භාවිතය
- ත්‍රිමාන ලක්ෂණ, පරිමාණය අනුව හැඩතල භාවිතය.
- ගැලපීම හා ත්‍රිමාන ලක්ෂණ අනුව වර්ණ භාවිතය.
- සමස්ත නිමාව.